සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

Learning Resource Centre
De Mazenod College
Kandana

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

50808

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 2 |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

සැළකිය යුතුයි.

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

## I කොටස

01. ඝන මීටරයට කිලෝග්‍රෑම් (kg $m^{-3}$) යන ඒකකයෙන් මනිනු ලබන රාශිය කුමක් ද?
(i) ද්‍රවාංකය (ii) ඝනත්වය (iii) තාපාංකය (iv) ප්‍රතිරෝධය

02. පහසුවෙන් සම්පීඩනය කළ හැකි ද්‍රව්‍යයකට නිදසුනක් වන්නේ,
(i) වීදුරුවක ඇති ජලය යි. (ii) කේක් මිශ්‍රණය යි.
(iii) සිමෙන්ති බදාම මිශ්‍රණය යි. (iv) හීලියම් වායුව පුරවන ලද බැලූනය යි.

03. ජල බදුනකට රතු තීන්ත බිංදුවක් දැමූවිට ජලය රතු පැහැ වේ. මෙයින් තහවුරු වන්නේ කුමක් ද?
(i) ද්‍රව පදාර්ථවල අංශුමය ස්වභාවය යි.
(ii) වායු පදාර්ථවල අංශුමය ස්වභාවය යි.
(iii) ඝන පදාර්ථවල ආසන්නත ස්වභාවය යි.
(iv) පදාර්ථවල භෞතික ස්වභාවය යි.

04. රසායනික විපර්යාසයක් නොවන්නේ කුමක් ද?
(i) ද්‍රව ඉටි ඝනීභවනය වීම. (ii) යකඩ ඇණ මලින වීම.
(iii) ගිනි කූරක් දැවීම. (iv) වියළි කෝෂයක් පරිපථයකට සම්බන්ධව ක්‍රියාත්මක වීම.

05. සීනි හා ඊස්ට් මිශ්‍රකර තැනූ ද්‍රාවණයක් බෝතලයකට දමා බැලූනය සවිකළ විට එහි රැස්වන වායුව විය හැක්කේ,
(i) නයිට්‍රජන් ය. (ii) ඔක්සිජන් ය.
(iii) කාබන්ඩයොක්සයිඩ් ය. (iv) හයිඩ්‍රජන් ය.




06. ප්‍රෝටීන් හා ලිපිඩ බහුල ආහාර මත ක්ෂුද්‍රජීවී ක්‍රියාව පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(i) පැසීම හා මුඩුවීම (ii) පූතිභවනය හා වයනය
(iii) පැසීම හා පූතිභවනය (iv) පූතිභවනය හා මුඩුවීම

07. A - මැරුණු ශාක හා සත්ත්ව කොටස් වියෝජනය කෙරේ.
B - අජීවී පෘෂ්ඨ මත හොඳින් වර්ධනය වේ.
C - පළිබෝධකයින් පාලනය සඳහා යොදා ගැනේ.
ඉහත ප්‍රකාශ අතුරින් ක්ෂුද්‍ර ජීවීන්ගේ අහිතකර බලපෑම් දක්වා ඇති ප්‍රකාශ වන්නේ,
(i) A පමණි. (ii) B පමණි. (iii) C පමණි. (iv) A හා B පමණි.

08. ආකන්ද මුල් සහිත ශාක පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(i) ගහල, ඉඟුරු, ලූනු  (ii) මඤ්ඤොක්කා, බතල, ඩේලියා

(iii) බීට්, රාබු, කැරට්  (iv) බුලත්, ගම්මිරිස්, වැනිලා

09. රූපසටහන් මගින් ආදර්ශනය කර ඇති සංසිද්ධි පිළිවෙලින් සඳහන් වරණය කුමක් ද?




(i) උත්ස්වේදනය, බිංදුදය, ආසෘතිය  (ii) ආසෘතිය, උත්ස්වේදනය, විසරණය

(iii) උත්ස්වේදනය, බිංදුදය, විසරණය  (iv) ආසෘතිය, බිංදුදය, විසරණය

10. කම්පන සංඛ්‍යාතය අධ්‍යයනය කිරීම සඳහා විද්‍යාගාරයේ යොදා ගන්නා සරසුල් පිළිබඳව පහත ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය තෝරන්න.

(i) සරසුලක බාහුවේ දිග අනුව ඒවායින් නැගෙන හඬ වෙනස් වේ.

(ii) සරසුලක බාහුවේ දිග වෙනස් වීමෙන් සංඛ්‍යාතය වෙනස් වේ.

(iii) සරසුලක බාහුවේ දිග අඩුවන විට සරසුලෙ සංඛ්‍යාතය වැඩි වේ.

(iv) සරසුලක බාහුවෙ දිග වැඩිවන විට සරසුලේ සංඛ්‍යාතය වැඩි වේ.

11. පහත දක්වා ඇත්තේ විද්‍යුත් උපාංග තුනක සංකේත වේ. නිවැරදි ලෙස පිළිවෙලින් නම් කර වරණය තෝරන්න.




(i) ඇමීටරය, වෝල්ට් මීටරය, සන්නායකය  (ii) වෝල්ට් මීටරය, ඇමීටරය, ඕම් මීටරය

(iii) ඇමීටරය, ප්‍රතිරෝධකය, වෝල්ට් මීටරය  (iv) විභව මානය, ප්‍රතිරෝධකය, ඇමීටරය

12. චුම්බකයක කෙළවරක් ඉදිකටුවක් මත තබා රූපයේ ආකාරයට එකම දිශාවට ඇදීම සිදු කිරීමෙන්,




(i) විද්‍යුත් ක්‍රමයට ස්ථිර චුම්බකයක් සෑදිය හැකිය.

(ii) ස්පර්ශ ක්‍රමයට ස්ථිර චුම්බකයක් සෑදිය හැකිය.

(iii) ක්ෂය වූ චුම්බක බල නැවත ලබාගැනීමට හැකිය.

(iv) ස්ථිර චුම්බකවල චුම්බක බලය ක්ෂය කළ හැකිය.

13. සර්වසම බල්බ හතරක් සහිත පරිපථ හතරක් පහත රූපයේ දැක්වේ. ස්විච්චිය වසා ඇති විට බල්බ හතර එකම දීප්තියෙන් නොදැල්වෙන පරිපථය කුමක් ද?



(i)  (ii)  (iii)  (iv)

14. රාත්‍රී අහසේ දක්නට ලැබෙන දීප්තිමත්ම තාරකාව වන සීරියස් පිහිටා ඇත්තේ පහත සඳහන් කුමන තරු රටාවේ ද?

(i) මහ බල්ලා (ii) ඔරායන් (iii) මහ වලසා (iv) දකුණු කුරුසිය

15. පහත ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය තෝරන්න.

(i) චන්ද්‍රයාගේ පරිභ්‍රමණය නිසා චන්ද්‍රකලා ඇති වේ.

(ii) ඍතු භේදය පැහැදිලිව දක්නට ලැබෙන්නේ ධ්‍රැව ආසන්න ප්‍රදේශවල ය.

(iii) පෘථිවියේ පරිභ්‍රමණ කාලය දින 28 කි.

(iv) සූර්ය ග්‍රහණයක දී සූර්යයා සහ පෘථිවිය අතර චන්ද්‍රයා පිහිටයි.

16. ආහාර පරිරක්ෂක ලෙස යෙදීමට නිර්දේශිත රසායන ද්‍රව්‍යයක් නොවන්නේ කුමක් ද?

(i) ඇසිටික් අම්ලය ය. (ii) සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් ය.

(iii) සෝඩියම් ක්ලෝරයිඩ් ය. (iv) සෝඩියම් බයි සල්ෆයිට් ය.

17. මූලද්‍රව්‍ය සෑදී ඇති පරමාණු පිහිටන ආකාරය පහත දක්වා ඇත. මූලද්‍රව්‍ය හා සංයෝග යන දෙකම දැක්වෙන රූපසටහන තෝරන්න.

(i)  (ii)  (iii)  (iv) 

18. භූගත කඳක කෘත්‍යයක් නොවන්නේ කුමක් ද?

(i) ආහාර සංචිත කිරීම (ii) ප්‍රචාරණය (iii) සංධාරණය (iv) කාලතරණය

19. පහත ලක්ෂණ අතුරින් මොලුස්කාවන්ගේ ලක්ෂණ පමණක් දක්නට ලැබෙන්නේ,

A - පේෂිමය පාදයක් සහිත වීම.

B - සංධි සහිත උපාංග තිබීම.

C - කවච සහිත මෘදු දේහ දැරීම.

(i) A හා B හි පමණි. (ii) A හා C පමණි. (iii) B හා C පමණි. (iv) A හි පමණි

20. ජල සංරක්ෂණය සිදුවන අයුරින් කෘෂිකාර්මික කටයුතු සැලසුම් කිරීම, නියං ආපදා කළමනාකරණයේ දී ගන්නා ක්‍රියාමාර්ගයකි. මේ සඳහා අවම වශයෙන් බලපාන සිදුවීමක් වන්නේ,

(i) නිවෙස්වල වැසි ජලය රැස් කිරීමට උපක්‍රම යොදා ඒවා නියං කාලයේ දී කෘෂිකර්මාන්තය සඳහා භාවිත කිරීම ය.

(ii) නියං ප්‍රතිරෝධී බෝග වගා කිරීමට පෙළඹවීම ය.

(iii) වැසි සමයේ වැඩි ජල පරිමාවක් එක් රැස් කර ගැනීම පිණිස ජලාශවල ජල ධාරිතාව වැඩි කිරීම ය.

(iv) ජල දූෂණය වැළැක්වීම හා ජල සංරක්ෂණය වැඩි කිරීමට නීතිරීති සම්පාදනය කිරීම ය.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

සැළකිය යුතුයි:

- පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04ක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. (පළමු ප්‍රශ්නය සඳහා ලකුණු 16ක් ද අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද පිරිනැමේ.

01. ස්වභාවික ආපදා පෙන්නුම් කරන රූප සටහන් 4ක් පහත දැක්වේ.

A. 

B. 

C. 

D. 

i. ඉහත ස්වාභාවික ආපදා 4 හඳුනාගෙන නම් කරන්න.

A. .................................................. B. ..................................................

C. .................................................. D. ..................................................

(ලකුණු 1 x 4 = 4)

ii. ශ්‍රී ලංකාව තුළ අත්විඳිය නොහැකි ආපදා තත්ත්වය ඉහත ඒවායින් කුමක් ද? (ලකුණු 1)

iii. A හි දැක්වෙන ආපදා තත්ත්වයට හේතුවන මානව ක්‍රියාකාරකම් 2ක් ලියන්න. (ලකුණු 2)

iv. රූපයේ දක්වා ඇති C ආපදා තත්ත්වය කෙරෙහි බලපාන හේතුවක් ඉහත දක්වා නැති වෙනත් ආපදා තත්ත්වයක් සඳහා ද බලපායි.

(a) එම ආපදා තත්ත්වය කුමක් ද? (ලකුණු 1)

(b) එයට හේතුව කුමක් ද? (ලකුණු 1)

v. B හි දැක්වෙන ආපදා තත්ත්වය පවතින අවස්ථාවක දී ඔබ විසින් නොකළ යුතු දේවල් 2ක් ලියන්න. (ලකුණු 2)

vi. C හි දැක්වෙන ආපදා තත්ත්වය නිසා ඇතිවන සෞඛ්‍ය ගැටලුවක් සඳහන් කරන්න. (ලකුණු 1)

vii. B හි දැක්වෙන ආපදාව ඇතිවීමට බලපාන හේතුවක් සඳහන් කරන්න. (ලකුණු 1)

viii. සුළු වැස්සකින් වුව ද කාණු පිටාර ගැලීමට හේතුවක් දක්වන්න. (ලකුණු 1)

ix. ආපදා මල්ලක තිබිය යුතු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය 2ක් ලියන්න. (ලකුණු 2)

02. ආහාර පරිරක්ෂණය කිරීම සඳහා භාවිත කරන ගෘහස්ථ නවීන ක්‍රමයක් වන සූර්ය තාප වියලනයක රූප සටහනක් පහත දැක් වේ.



i. සූර්ය තාපය යොදාගෙන සාම්ප්‍රදායිකව ආහාර වියළා පරිරක්ෂණයට සකස් කරගත් ආහාර වර්ග දෙකක් ලියන්න. (ලකුණු 2)

ii. ඉහත දක්වා ඇති සූර්ය තාප වියලනය මගින් ආහාර වියළීම, ආහාර සූර්ය තාපයට සෘජුව නිරාවරණය කර වියළා ගැනීමට වඩා සාර්ථක වීමට හේතු දෙකක් ලියන්න. (ලකුණු 2)

iii. පහත ආහාර වර්ග සඳහා සුදුසු පරිරක්ෂණ ක්‍රමය සඳහන් කරන්න.

(a) දියර කිරි -

(b) මස්, මාළු, අයිස් ක්‍රීම් - (ලකුණු 1 x 2 = 2)

(B) පහත සඳහන් වගන්ති නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.

(a) පළතුරු මැස්සා සම්පූර්ණ රූපාන්තරණය පෙන්වයි. ( )

(b) ජීවන චක්‍රයේ වර්ධණ අවධි කිහිපයක් තිබීම, ජීවියාගේ පැවැත්ම තහවුරු කරයි. ( )

(c) සතුන්ගේ ජීවන චක්‍ර පිළිබඳ දැනුම වඩාත් වැදගත් වන්නේ ජෛව විවිධත්වය සුරැකීම සඳහා ය. ( )

(d) ශ්වසනයට අවශ්‍ය ඔක්සිජන්, පූටිකා හරහා ශාක පත්‍රය තුළට විසරණය වේ. ( )

(e) ගෝලීය උණුසුම ඉහළ යාමේ වේගය ප්‍රභාසංස්ලේෂණය මගින් පාලනය කෙරේ. ( )

(ලකුණු 1 x 5 = 5)

03. A. 8 ශ්‍රේණියේ සිසුවෙක් විද්‍යුත් ධාරාවක් ගමන් කරවීම සඳහා සකස් කරන ලද ඇටවුම් කිහිපයක් පහත දැක්වේ.




Learning Resource Center De Mazenod College Kandana R

i. A, B, C, D යන ඇටවුම්වලින් බල්බය දැල්වෙන්නේ කුමන ඇටවුම්වල ද? (ලකුණු 2)

ii. A හි යොදාගෙන ඇති විද්‍යුත් විච්ඡේද්‍යය කුමක් ද? (ලකුණු 1)

iii. (a) විද්‍යුත් ලෝහාලේපනය සඳහා භාවිත කරන ඇටවුම කුමක් ද? (ලකුණු 1)

(b) එහිදී ඔබට නිරීක්ෂණය කිරීමට හැකි වන්නේ කුමක් ද? (ලකුණු 1)

B. (i) ඔබට වියළි කෝෂයක්, ස්විච්ඡයක්, බල්බයක්, සම්බන්ධක කම්බි, වෝල්ට් මීටරයක් සපයා ඇත්නම්, බල්බයේ දෙකෙළවර විභව අන්තරය සෙවීම සඳහා සුදුසු පරිපථයක් ඇඳ දක්වන්න. (ලකුණු 3)

(ii) පහත උපකරණවල කාර්යය සඳහන් කරන්න.

(a) ධාරා නියාමකය

(d) ආලෝක සංවේදී ප්‍රතිරෝධකය

(c) ටකන යතුර (ලකුණු 3)

04. A. i. මෙම රූපය හඳුන්වන්නේ කුමන නමකින් ද? (ලකුණු 1)

ii. මෙහි සඳහන් ආකාරයට ගින්නක් නිවීමට, ඉවත් කළ යුතු සාධක මොනවා ද? (ලකුණු 2)




iii. ඉහත සිද්ධිවල දී ගින්න නිවී යන්නේ කුමන සාධකය ඉවත්වීම නිසා දැයි ලියන්න.

(a) ගිනි අඟුරු මතට ජලය ඉසීම.

(b) ඇඳ සිටි ඇඳුමට ගිනි ඇවිලුන විට බිම පෙරළීම.

(c) දැවෙන පොත් රාක්කයක, නොදැවෙන පොත් ඉවත් කිරීම.

(ලකුණු 1 x 3 = 3)

B. හිස්තැනට සුදුසු වචනය පහත සඳහන් වචනවලින් තෝරා ලියන්න.

(භංගුරතාව, වාහන ටයර් හා ටියුබ්, ටැල්ක්, L.P. වායුව, ලෝහක දීප්තිය, ඇලුමිනියම්, තාප සන්නායකතාව, පහළ ද්‍රවාංකය, දෘඪතාව, ප්‍රසාරණය, වානේ)

| භෞතික ගුණය | ද්‍රව්‍ය | යොදාගන්නා අවස්ථාව |
|---|---|---|
| 1. සිනිඳු වයනය | (a) ................................ | පුයර භාවිතය |
| 2. (b) ................................ | රන්/රිදී | ආභරණ සෑදීම |
| 3. ප්‍රත්‍යස්ථතාව | රබර් | (c) ................................ |
| 4. විද්‍යුත් සන්නායකතාව | (d) ................................ | විදුලි රැහැන් |
| 5. (e) ................................ | රීයම් | පෑස්සීම |

(ලකුණු 1 x 5 = 5)

05. A. පහත ඇටවුම 8 ශ්‍රේණියේ ශිෂ්‍ය කණ්ඩායමක් විසින් මලබැඳීම සඳහා ඉවහල් වන විවිධ සාධක අතුරින් එක් සාධකයක් අවශ්‍ය බව පරීක්ෂා කිරීමට සකසන ලද්දකි.




i. මෙම ඇටවුම මල බැඳීම සඳහා බලපාන කුමන සාධකය පරීක්ෂා කිරීමට කරන ලද ඇටවුමක් ද? (ලකුණු 1)

ii. (a) ඉහත ඇටවුම සකස් කර දින කීපයකට පසු නිරීක්ෂණය කළ හැක්කේ කුමක් ද? (ලකුණු 1)

(b) එම නිරීක්ෂණයට හේතුව කුමක් ද? (ලකුණු 1)

iii. ඉහත පරීක්ෂණය සඳහා සුදුසු, පාලක පරීක්ෂණය පෙන්නුම් කරන නම් කළ රූප සටහනක් අඳින්න. (ලකුණු 1)

iv. යකඩ මල බැඳීමෙන් ආරක්ෂා කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

B. P කාණ්ඩය හා Q කාණ්ඩය ගළපා Q හි අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.

| P කාණ්ඩය | | Q කාණ්ඩය |
|---|---|---|
| i. උදාසීන ද්‍රව්‍ය | ☐ | A. ෆිනෝල්ප්තැලීන් දැමූ විට රෝස පැහැ වේ. |
| ii. භෂ්ම | ☐ | B. රතු හෝ නිල් ලිට්මස් වර්ණ වෙනස් නොකරයි. |
| iii. අම්ල | ☐ | C. pH අගය 7ට වඩා අඩුයි. |
| iv. සෝඩියම් ක්ලෝරයිඩ් | ☐ | D. භාෂ්මික ද්‍රව්‍යයකි. |
| v. මිල්ක් ඔෆ් මැග්නීසියා | ☐ | E. උදාසීන ද්‍රව්‍යයකි. |

(ලකුණු 1 x 5 = 5)

06. A. පහත ශාක පත්‍ර පිළිබඳ ව අවධානය යොමු කරන්න. (බෝ, අක්කපාන, අරලිය, නෙළුම්)

(i) එම එක් එක් ශාක පත්‍රය හඳුනාගත හැකි විශේෂ බාහිර ලක්ෂණය බැගින් ලියන්න. (ලකුණු 3)

(ii) ජලය ගබඩා කරන පත්‍රයක් වන්නේ කුමක් ද? (ලකුණු 1)

(iii) උත්ස්වේදනය අවම කර ගැනීම සඳහා අරලිය පත්‍රය දක්වන අනුවර්තනයක් ලියන්න. (ලකුණු 1)

(iv) මඤ්ඤොක්කා අල සෑදෙන්නේ කුමන මුල් වර්ගයක ආහාර තැන්පත් වීමෙන් ද? (ලකුණු 1)

B. (i) ඝන ද්‍රව්‍යයක්, ද්‍රවයක් බවට පත්වන නිශ්චිත උෂ්ණත්වය හඳුන්වන්නේ කුමන නමකින් ද? (ලකුණු 1)

(ii) කැකෑරුම් නලයක්. ජලය, උෂ්ණත්ව මානයක්, ආධාරකයක්, බන්සන් දාහකයක් සපයා ඇත්නම්, ද්‍රව්‍යයක ද්‍රවාංකය සෙවීම සඳහා සුදුසු ඇටවුම ඇඳ දක්වන්න. (ලකුණු 2)

(iii) සම්මත වායුගෝලීය පීඩනයේ දී සංශුද්ධ ජලයේ තාපාංකය කොපමණ ද? (ලකුණු 1)

(iv) සනත්ව කුප්පිය මගින් සමාන පරිමාවක් නැවත නැවත මැන ගැනීමේ හැකියාව පවතී. මේ සඳහා එහි මූඩියේ ඇති විශේෂ ලක්ෂණය කුමක් ද? (ලකුණු 1)

07. A. වරහන් තුළ දී ඇති වචන අතුරින් හිස්තැන පිරවීමට සුදුසු වචනය තෝරන්න.

(i) වයලීනයක තත් වඩා වැඩියෙන් ඇදී ඇති විට ඇතිවන්නේ ..................................................
(පහත් ස්වරයකි / උච්ච ස්වරයකි.

(ii) සංගීත චිකිත්සාව මගින් ඇතැම් මානසික අවපීඩන තත්ත්ව සමනය කරගත ...........................
(හැකි වේ. / නොහැකි වේ.)

(iii) මිනිසාගේ ශ්‍රව්‍යතා සීමාව ................................ (20 Hz - 20 000Hz / 20 Hz - 40 000 Hz)

(iv) සංඛ්‍යාතය වැඩි හඬක් ලබා ගත හැකි වන්නේ බෙරයක පටලය ..................................
(තුනී වූ විටය. / ඝනකමින් වැඩි වූ විටය.)

(v) සංගීත භාණ්ඩවල කම්පනය වන කොටස්වල දිග සීරුමාරු කිරීමෙන් සංඛ්‍යාතය වෙනස් කළ .................................. (හැකි වේ. / නොහැකි වේ.)

(ලකුණු 1 x 5 = 5)

B. (i) පහත දැක්වෙන සතුන් අතුරින් පෘෂ්ඨවංශී සතුන් හා අපෘෂ්ඨවංශී සතුන් ලෙස වෙන් කරන්න.
(බත් කූරා, සලමන්දරා, කැහිබෙල්ලා, මඩුවා, කුඩැල්ලා) (ලකුණු 2)

(ii) රෙප්ටීලියාවන්ගේ එක් විශේෂ ලක්ෂණයක් ලියන්න. (ලකුණු 1)

(iii) මුත්‍රාවල අඩංගු සංඝටක දෙකක් ලියන්න. (ලකුණු 1)

(iv) වෘක්කවල ඇතිවන ආබාධ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)